මගේ අංකය : TF/PRO /MA-2/6
2026-06-11 දින.

**<u>එල්ෆින්ස්ටන් රඟහල ආරම්භ වී වසර 100ක් සම්පූර්ණ වීම පිළිබඳව පර්යේෂණයක් සිදුකිරීම සඳහා මිළ ගණන් කැඳවීම.</u>**

බුද්ධශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වන ටවර් හෝල් රඟහල පදනමට අයත් මරදාන එල්ෆින්ස්ටන් රඟහලට වසර 100ක් සම්පූර්ණ වීම හේතුවෙන් රඟහලේ ඉතිහාසය පිළිබඳව පර්යේෂණයක් සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාල පිය ඇතුළු පර්යේෂකයන් හා පර්යේෂණ ආයතනවලින් මිල ගණන් කැඳවීමට පාලනාධිකාරිය තීරණය කර ඇත.

ඒ අනුව ඇමුණුමේ සඳහන් කොන්දේසි වලට අනුව මුද්‍රාතබන ලද මිළ ගණන් 2026.06.25 දින පෙ.ව.11.00 ට පෙර**"සභාපති ,ප්‍රසම්පාදන කමිටුව,ටවර් හෝල් රඟහල පදනම, සව්සිරිපාය, අංක 123, විජේරාම මාවත, කොළඹ -07 "** යන ලිපිනයේ පිහිටි ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් බහාලනයට අතින් ගෙනැවිත් හෝ එදින පෙ.ව.11.00 ට පෙර ලැබෙන සේ උක්ත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. ප්‍රමාද වී ලැබෙන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් අයෙකුට සහභාගී විය හැකිය.

මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ " **පර්යේෂණයක් සඳහා මිළ ගණන්** " ලෙස සඳහන් කරන ලෙස කාරුණිකව වැඩිදුරටත් දන්වා සිටිමි.

**නිපුණ දිසානායක**
අධ්‍යක්ෂ(පාලන හා සංවර්ධන)
**දු.ක. : 0112682324**
**ෆැක්ස් අංකය : 0112678517**
**විද්‍යුත් තැපැල :** towersl@sltnet.lk

ඇමුණුම 01

**<u>එල්ෆින්ස්ටන් රඟහල ආරම්භ වී වසර 100ක් සම්පූර්ණ වීම පිළිබඳව පර්යේෂණාත්මක කෘතියක් නිර්මාණය කිරීම</u>**

පර්යේෂණය පිලිබඳ කොන්දේසි.

1. එල්ෆින්ස්ටන් රඟහලේ ඉතිහාසය පිළිබඳ පර්යේෂණාත්මක කෘතියක් රචනා කළ යුතුය.
2. මුද්‍රිත පිටු 140 හෝ 180 අතර විය යුතුය. (පර්යේෂණයේ ස්වභාවය අනුව වෙනස් විය හැකිය) ශාස්ත්‍රිය බසින් , රචනා ශෛලයකින් හා ශාස්ත්‍රිය මූලධර්ම වලට අනුරූපව රචනා විය යුතුය.
3. රචකයාට පර්යේෂණ කටයුතු පිළිබඳ උනන්දුව,තොරතුරු රැස්කිරිමේ හැකියාව, අධ්‍යාපනික වාර්තා ලිවිමේ හැකියාව තිබිය යුතුය.
4. A3 ප්‍රමාණයෙන් විය යුතු අතර Pont size 12 හා අකුරු වර්ගය FM අභය විය යුතු අතර පේළි අතර පරතරය 1.5 විය යුතුය.
5. කෘතිය මාතෘකා ,අනු මාතෘකා ආදිය ප්‍රධාන තේමාවට ගැලපෙන සේ මැනවින් සැකසුණු ශාස්ත්‍රිය මූලධර්මවලට අනුරූපි ශාස්ත්‍රිය ලියවිල්ලක් විය යුතුය.
6. රචකයා මානව ශාස්ත්‍ර /කලා/ලලිතකලා/ප්‍රාසාංග කලා/සමාජ විද්‍යා යන විෂය ධාරාවේ උපාධිය සහ පශ්චාත් උපාධිය සහිතව වසර 10ක පළපුරුද්දක් තිබිම හෝ උපාධිය නොමැති වුවද පර්යේෂණ ක්ෂේත්‍රයේ වසර 20 ක පලපුරුද්දක් තිබීම.
7. සම්පූර්ණ කරන ලද කෘතිය සැප්තැම්බර් මස 30 වන දිනට පෙර අප වෙත භාරදිය යුතුය.
8. මෙම නිර්මාණය ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යාපන,පර්යේෂණ,සංරක්ෂණ හා නාට්‍ය අංශය සමඟ එක්ව නිර්මාණය කළ යුතුය.
9. පර්යේෂණය කිරිමට තෝරාගත් අය සඳහා පර්යේෂණය ආරම්භ කිරිමට පෙර 20% ක අත්තිකාරම් මුදලක් ලබා දිය හැකි අතර ඒ සඳහා බැංකු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.
10. මිළ ගණන් සමඟ පර්යේෂණය සිදුකරනු ලබන අයගේ ජිවදත්ත පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතුය.